<u>මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව</u>

## <u>2022 ජූලි 21 වන දින</u>

❖ **08 වන සැසි වාරයේ 51 වන සභා වාර්තාව**

දිනය :- **2022.07.21** වන දින

වේලාව :- පෙ.ව.**10.00**

ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය

<u>පැමිණීම</u>

| | | |
|---|---|---|
| 01. | ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. | ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. | ගරු ප්‍රා.ස,ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. | ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. | ගරු ප්‍රා.ස.ම. ජේ.එල් ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 06. | ගරු ප්‍රා.ස.ම. එම්.සී.සී.කැළුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. | ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. | ගරු ප්‍රා.ස.ම. ශේ.රන්ජන් වීරශේකර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 09. | ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. ගුණනදාය මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10. | ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 11. | ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 12. | ගරු ප්‍රා.ස,ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව.10.00 |
| 13. | ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 14. | ගරු ප්‍රා.ස.ම. කේ.කේ.ජී. සුමේත්‍රා මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 15. | ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 16. | ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 17. | ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 18. | ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 19. | ගරු ප්‍රා.ස.ම. සුගත් සරබිගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 20. | ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 21. | ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නියංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |

22. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිශ්චන්ද්‍ර මැතිතුමා — පෙ.ව. 10.00

23. ගරු ප්‍රා.ස.ම. එන්.ජී.එස්. වීරසිරි මැතිතුමිය. — පෙ.ව. 10.00

24. ගරු ප්‍රා.ස.ම. රමනී හල්පෙ ගමගේ මැතිතුමිය. — පෙ.ව. 10.00

25. ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්මි තිලක් මැතිතුමා. — පෙ.ව. 10.00

26. ගරු ප්‍රා.ස.ම. ටී.බී. ඉන්දික මැතිතුමා. — පෙ.ව. 10.00

27. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය — පෙ.ව. 10.00

28. ගරු ප්‍රා. ස. ම. ජේ.ජී. ගාමිණී මැතිතුමා — පෙ.ව. 10.00

29. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. — පෙ.ව. 10.00

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රා.ස.ම. ජේ.වී.ශාන්ත ජයලත් මැතිතුමා.

**සහභාගී වූ නිලධාරීන්**

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රන්දූල මයා.

02. කළමනාකරණ සේවා නිලධාරී - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණ සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගී වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදී. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ ජූලි මස මහ සභා රැස්වීම සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමන්, හිටපු සභාපතිතුමන්ලා , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාව ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගී වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මේ සභාවේ අද දින සුවිශේෂී වූ කාර්ය භාරයක් සිදු කරන්නට තිබෙනවා. අපේ සභාවේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පුරප්පාඩු වූ මන්ත්‍රී ධූරය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයක් නිකුත් කරමින් මන්ත්‍රීවරයෙකු තෝරා පත් කර එවා තිබුණා. එතුමා දීර්ඝ කාලයක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස අප සමග කටයුතු කළ කෙනෙක්. අපි එතුමාගේ දිවුරුම දීම සහ සහෝදර මන්ත්‍රීවරුන්ගේ සුභාශිංසන එක් කිරීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අනතුරුව පළාත් පාලන ආයතන සභික ධූර පුරප්පාඩු සම්බන්ධයෙන් නිකුත් කරන ලද y2265/31 අංක හා 2022.02.01 දිනැති ගැසට් පත්‍ර නිවේදනය අනුව ජයසේකර ලියනගේ ජයන්ත මැතිතුමා ප්‍රාදේශීය සභා සභික ධූරයෙහි ගරු සභාපතිතුමා ඉදිරියේ දිවුරුම් දෙන ලදී.

**ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. අද දින ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙස දිවුරුම් දෙමින් අප සමග කටයුතු කරන්නට එකතු වූ ගරු ජේ.එල් ජයන්ත මන්ත්‍රීතුමන් පසුගිය කාල වකවානුවල හැරුණු කොට දීර්ඝ කාලයක් තිස්සේ අප සමග එක්ව කටයුතු කළ අයෙක් .1991 වැනි කාලයේදී එතුමන් මම සහ ගරු විපක්ෂනායක තුමන් මෙන්ම ගරු සුගත් සරඹගේ මන්ත්‍රීතුමන් තමයි දැනට සිටින අය අතුරින් මුල්ම කාලයේ සිට මේ සභාව නියෝජනය කරන ලද්දේ.එතුමා කුමන පක්ෂයක සිටියත් අපි සමග ඉතා සුහද සිලිව කටයුතු කළ අයෙක්. හොඳ කළ්‍යාණ මිත්‍රයෙක්. මම එතුමන්ට සුභ පතන්න මේ අවස්ථාව යොදා ගන්නවා. ස්තුතියි

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. එක්සත් ජාතික පක්ෂයේ චමිල් උදාර මන්ත්‍රීතුමන්ගේ හැඩිකීමත් සමග පුරප්පාඩු වූ මන්ත්‍රී ධුරය සඳහා ගරු ජේ.ඒල් ජයන්ත මන්ත්‍රීතුමන් අද සභාවේ සතියෙක් ලෙස දිවුරුම දුන්නා. මගෙත් ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙක් ,මම 1991 මෙම සභාවට පැමිණෙන විට එතුමා මේ සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළා. භීෂණ සමය තුළ කටුවන ප්‍රාදේශීය සභාව තමයි ප්‍රාදේශීය සභා අතර පවත්වන්නට යෙදුණු එකම සභාව. අපි ඒ කාලයේ ඉතා දුෂ්කර ලෙස තැන් තැන් වල සභාව පැවැත්වුවා. මේ කටුවන ප්‍රාදේශීය සභාව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මෙහෙයක් පවත්වා ගෙන ඒමට එතුමා විශාල මෙහෙයක් සිදු කළා. ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ. ඒල් . ජයන්ත මන්ත්‍රීතුමන් ඉතා සුහදව කටයුතු කළ හැකි අයෙක්. එතුමා ගැන දන්නා හඳුනන මන්ත්‍රීවරුන් පිරිසක් තමයි මේ සභාවේ ඉන්නේ. ඒ නිසා ඉදිරි කෙටි කාලය වුණත් අපට එකතු වෙලා වැඩ කරන්න පුළුවන්. අනෙක් කාරණය විදියට අද දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 08 වන විධායක ජනාධිපතිවරයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමන් දිවුරුම් දෙන අවස්ථාවේ අපිට හැකි වුණා ගරු ජේ.ඒල් ජයන්ත මන්ත්‍රීතුමන්ගේ දිවුරුම් දීමට එකතු වෙන්න. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු පක්ෂ වල නායකයින් එකතු වෙලා 08 වන විධායක ජනාධිපතිවරයා ලෙස එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමන් පත් කර ගෙන ඇති අවස්ථාවේ අපි සියලු දෙනාම එක්ව මේ ගමන සමුයි කියා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා**

සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු ප්‍රා.ස.ම. ජේ.එල් ජයන්ත මැතිතුමන් අපි සමග එක් වීම මම ඉතා භාග්‍යයක් සේ සළකනවා. එතුමා මේ සභාවට අද නොවෙයි ආරම්භයේ සිටම සිටිය යුතු පුද්ගලයෙක්. දීර්ඝ කාලයක් මේ සභාවේ කටයුතු කළ අත්දැකීම් සහිත අයෙක්. සියලු දෙනා සමග සුහදශීලිව කටයුතු කළ කෙනෙක්. ඒත් එක්කම එතුමා ප්‍රදේශය වෙනුවෙන් යම් දෙයක් කිරීමට ඇත්නම් එය නොපිරිහෙළා ඉටු කරන පුද්ගලයෙක් බව මම පෞද්ගලිකව දන්නවා. එවැනි වැඩ කිරීමට දන්න සහ හැකියාව ඇති කෙනෙක් අපේ මන්ත්‍රී මණ්ඩලයට එකතු වීම විශාල සතුටක්. එතුමාට තව දුරටත් ඒ සේවය සැපයීමට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමින් සියලු දෙනාටම ස්තුති වන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා

**ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා**

සියලු දෙනාගෙන්ම අවසරයි. මටත් ගරු ප්‍රා.ස.ම. ජේ.එල්. ජයන්ත මැතිතුමන් පිළිබඳ යමක් කියන්න අවශ්‍යයි. එතුමන් අපි මේ සභාවට එන විටත් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස සිටියා. එතුමා මහජන සේවයට කැප වුණු සියලු දෙනා සමගම ඉතා සහයෝගයෙන් යුතුව වැඩ කරන නිතරම සිනා මුසු මුහුනින් ඉන්න චරිතයක්. එතුමා මේ සභාවට කෙටි කාලයකට හෝ පැමිණීම ඉතා සතුටක්. ආයෙත් එතුමන්ට තම බල ප්‍රදේශයේ ජනතාව වෙත සේවය කිරීමට ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරමින් කරමින් සියලුම දෙනා වෙනුවෙන් ඔබතුමන්ට සුභපැතුම් එක්කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලුම සභික වරුන්ගෙන්ද අභිනව සභික ධුරයෙහි දිවුරුම් දුන් ගරු ප්‍රා.ස.ම. ජේ.එල් ජයන්ත මැතිතුමන් ගෙන්ද අවසරයි. මෙම සභාව තුළ ඉතා ජ්‍යෙෂ්ඨයෙකු විදියට ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමන් හා සමානවම ජේ.එල් ජයන්ත මැතිතුමන්ද ජනප්‍රියම බහුල පුද්ගලයෙක් විදියට මං දකිනවා. එතුමා පසුගිය කාලය තුළ නොසිටීම මේ සභාවට ඉතා පාඩුවක් වුණා. එතුමා මිද්දෙනිය ජනතාවගේ ජල ප්‍රශ්නය වෙනුවෙන් විශාල ලෙස මැදිහත් වූ පුද්ගලයෙක්. ගරු ගුණපාදාස මන්ත්‍රීතුමන් කියූ පරිදි එතුමා සමාජ සේවකයෙක්. පසුගිය දේශපාලන වටපිටාව තුළ එතුමන්ගේ හැකියාව සහ සම්බන්ධකම් මත එතුමා දේශපාලනය කළා නම් අද වන විට ආර්ථික අතින් ඉතා ඉහළ මට්ටමක සිටිනවා. නමුත් එතුමා ගම සමග ගමේ ජනතාව සමග සිටිමින් දේශපාලනය කළ අයෙක්. අපිට මිද්දෙනිය ජනතාවගේ ප්‍රශ්න ගැටළු සඳහා මැදිහත් වෙන්න අපිට තවත් ජනතා නියෝජිතයෙක් ලැබීම ඉතා සතුටක්. ඒත් එක්කම මිද්දෙනිය පොළ, මිද්දෙනිය ජල ප්‍රශ්නය ආදී ජනතාවගේ ඇවෙන ප්‍රශ්න වලදී එතුමා අපි සමග කටයුතු කළා. මුල් කාලයේ කුඩගොඩ , දම්බකලාව ආදී ප්‍රදේශවල ජනතාවගේ ජල ප්‍රශ්නය ඉතාමත් ගැඹුරින් ඔබතුමන්ටත් දැනෙන්න ඇති. පසුගිය කාලය තුළ අපේ ගරු සභාපතිතුමන් හා එක්ව අපි ඒ ජල ප්‍රශ්නය බොහෝ දුරට විසඳන්න කටයුතු කළා. මේ වන විට රටේ ජාතික දේශපාලන නායකත්වය සමග අපි තීරණාත්මක ගමනක් යන්න සූදානම් වූ මොහොතක ඔබතුමන්ද අපි සමග එක් වීම විශාල ශක්තියක් කොට සලකනවා. ඒත් එක්කම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවංක ආදර ගෞරවයත් ඔබතුමන්ට මෙම සභාව පමණක් නොව ඊට එහා සභාවන්ද නියෝජනය කරන්න අවශ්‍ය ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමින් අපි සමග එක්ව ඉදිරි කාලය තුළ ජනතා සේවය සඳහා කැපවීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

## ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා

සියලු දෙනාගෙන්ම අවසරයි. අද ඉතා සතුටු දවසක් . දීර්ඝ කාලයක් අපි සමග කටයුතු කළ ඉතා විශාල ජනතා සේවයක් කළ පුද්ගලයෙක් ලෙස ගරු ප්‍රා.ස.ම. ජේ.එල්. ජයන්ත මැතිතුමා නැවතත් අපි සමග එක් වීම ඉතා භාග්‍යයක් කොට සලකනවා. එතුමාට ඉදිරි වැඩ කටයුතු සඳහා ශක්තිය , ධෛර්යය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

## ගරු ප්‍රා.ස.ම. ජේ.එල්. ජයන්ත මැතිතුමා

ගරු සභාපතිතුමන් ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා මෙන්ම ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමිය ගෙන්ද අවසරයි. මම මේ සභාව නියෝජනය කරමින් 1990 සිට කටයුතු කළා. නමුත් පසුගිය ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ගරු ප්‍රා.ස.ම.සනත් මැතිතුමන් සමග තරග කර පරාජයට පත් වුණා. නමුත් මගේ හිතේ කිසිදු චකිතයක් , අමනාපයක් ඒ සම්බන්ධයෙන් නැහැ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ චමිල් උදාර මන්ත්‍රීතුමන් පක්ෂය හැර යාම හේතු කර ගෙන හිස් වූ මන්ත්‍රී ධුරය වෙනුවෙන් නැවතත් මං පත් කරනු ලැබුවා. මේ සඳහා අපේ පක්ෂයේ නායක තුමා, මහ ලේකම් තුමන්, ආසන සංවිධායක තුමන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කළමණාකාරතුමන්, අනෙකුත් සභා වල මන්ත්‍රීවරුන්ද මේ සඳහා සහයෝගය ලබා දුන්නා. ඒ සඳහා ස්තූති වන්ත වෙමින් සභාවේ ලේකම් තුමා දුරකථන ඇමතුමෙන් කළ ආරාධනයෙන් මම අද මේ සභාවට සහභාගී වුණා. වසර 27ක් පමණ මම සභාවේ කටයුතු කළා. සභික වරුන් බොහෝ දන්නා අය අතර නොදන්නා අය කිහිප දෙනෙක් ඉන්නවා. සියලු දෙනාම මා උණුසුම් අන්දමින් පිළිගෙන සුභ පැතුවා. මම මෙතෙක් කළ සමාජ සේවය ගැන සතුටු වෙනවා. ඉදිරි කෙටි කාලය තුළ සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයට මෙන්ම ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට මාගෙන් ඉටු විය යුතු සේවය නොපිරිහෙළා ඉටු කිරීමටත් ඉදිරියේදී ඉතා සහයෝගයෙන් යුතුව හරිදේ හරි ලෙස දකිමින් වැරදි දේ පෙන්වා දෙමින් කටයුතු කර උපරිම ජනතා සේවයක් කරන්න මං බලාපොරොත්තු වෙනවා. ස්තූතියි.

**<u>01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.</u>**

2022 ජූනි මස 23 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම වාර්තාවේ දැන ගැනීමට අවශ්‍ය කරුණු කිහිපයක් තියෙනවා. මෙහි මුදල් කමිටු වාර්තාවෙහි

01. අංක 68 යටතේ මිද්දෙනිය අකුර ජල පොම්පාගාරයේ ස්වයං ගිනි ගැනීමක් ගැන සඳහන් වෙනවා. එහි උපාංග මිලදී ගැනීම සඳහා රු. 42244.00ක අත්තිකාරමක් ලබා ගෙන තියෙනවා. මේ ස්වයං ගිනි ගැනීම කියන්නේ කුමක්ද? එහි අත්තිකාරම් මුදල මෙය නම් මුළු මුදල කීයද? ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍යයි.
02. අංක 83 යටතේ කටුවන සභාවට අවශ්‍ය යන්ත්‍රයක් මිලදී ගැනීම කියලා සටහන් වෙනවා. මෙය කුමන යන්ත්‍රයක්ද?
03. අංක 84 යටතේ කටුවන ප්‍රාදේශීය සභාවට අයත් විදි පහන් සකස් කිරීමට අවශ්‍ය හැඩල් නිර්මාණය කිරීම සඳහා රු. 18000.00 ක මුදලක් සටහන් වෙනවා. නමුත් පසුගිය කාලය තුළ විදි පහන් සවි කරන්න අවශ්‍යතාවයක් වුණේ නැහැ. තියන විදි පහන් පවා අක්‍රිය කරලා තමයි තිබුණේ. කටුවන නගරයේ විදි පහන් දෙකක් පමණයි තියෙන්නේ. මේ කුමක් සඳහා සකස් කළාද යන්න ගැටළුවක්. ඒත් එක්කම පසුගිය කාල වකවානුව තුළ විදුලි උපකරණ මිලදී ගැනීම සහ ඒ කිනම් කාල පරාසයක් තුළද යන්න දැන ගැනීමට අවශ්‍යයි. ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරි සභාවට බලාපොරොත්තු වෙනවා.
04. අංක 85 යටතේ දම්මික ට්‍රේඩ් සෙන්ටර් ආයතනයෙන් කොම්පෝස්ට් ව්‍යාපෘතියට අවශ්‍ය එකක් මිලදී ගැනීම කියලා තමයි මෙහි සඳහන් වෙන්නේ. ඒ ගැන පැහැදිලි විස්තරයක් නැහැ. නමුත් මේ වාර්තාව තමයි පළාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස් ආදී කාර්යාල වලට යන්නේ. යම් නඩුවකට ඉදිරිපත් කරන්න වුවහොත් ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මෙය නිවැරදිව තිබිය යුතුයි.
05. අංක 89 යටතේ චමින්ද ලාල් මහතාගෙන් කටුවන මාළු වෙළඳපොළ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වැලි මිලදී ගැනීම වෙනුවෙන් රු. 161000.00ක් ගෙවා තිබෙනවා. මීට මාස කිහිපයකට පෙරත් මෙවැනි වවුචරයක් ඉදිරිපත් වුණා වගේ මතකයි. එම කාර්යය සඳහා මෙම සභා භූමියෙහි තිබුණ වැලිත් යොදා ගෙන තියෙනවා. ඒ සම්බන්ධවත් ගැටළුවක් තියෙනවා.
06. අංක 93 යටතේ කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනවසර කසළ බැහැර කරන ස්ථානයන්හි සවි කිරීමට අවශ්‍ය දැන්වීම් පුවරු සඳහා ආධාරක හා රාමු නිර්මාණය කිරීම වෙනුවෙන් රු.180000.00ක ගෙවීමක් සඳහන් වෙලා තියෙනවා. මෙපමණ මුදලක් ඒ සඳහා වැය වුණාද? මේ සඳහා වැය වූ මුදල කීයද? මෙය වැරදීමකින් සටහන් වෙලා නම් එසේ වූයේ ඇයි?

මුදල් කමිටු වාර්තාවේ සඳහන් මේ ගැටළු සඳහා මම ඉදිරි සභාවට පිළිතුරු බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම මෙම වාර්තාවේ පිටු අංක 19 හි යෝජනා අංක 08-08 යටතේ වවුචරු ගෙවීමක් සඳහන් වෙනවා. එහි මහජන පොළ භූමියේ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති කොට්ට 90ක් රු. 247500.00ක් ගෙවා මිලදී ගෙන තියෙනවා. ඒ කියන්නේ කොට්ටයක් රු. 2750.00ක් පමණ වෙනවා. එවැනි මුදලකට මිලදී ගැනීම පිළිබඳවත් ගැටළුවක් තියෙනවා. මෙහෙම සිමෙන්ති විකුණන තැනක් තියනවද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, මේ කිරම ලලන්ත හාඩ්වෙයාර් කියන ආයතනයෙන් තමයි ගත්තේ . ඕය මිල ගණන් යටතේ වත් ගන්න වෙන කොහේවත් තිබුණෙ නැහැ. මිද්දෙනියෙ රු.3000.00ක් පමණ වුනා. මේ කාර්යය කඩිනමින් කරන්න ඕන නිසා එතැනින් අරගත්තා.

මුදල් කමිටු වාර්තාව සම්බන්ධ අදාළ ක්‍රියාපිළිවෙල අනුගමනය කර පවතින ගැටළු සඳහා පිළිතුරු ඊළග සභාවට ලබා දෙන්නම්.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඒ අනුව නිහඩතාවයෙන් පෙනී යන්නේ නව දුරටත් පහුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි. ඒ අනුව සංශෝදන සහිතව වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ජ්. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජුනි මස 23 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**22. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන -** නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -** නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05 – 1. රථ වාහන නැවතුම් බදු අයකිරීම සම්බන්ධවයි**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

රථ වාහන නැවතුම් බදු අය කිරීම සම්බන්ධවයි මැයෙන් මිද්දෙනිය, ශ්‍රී මහින්ද නාහිමි මාවතෙහි , සිතාර ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. අනුර මයා විසින් 2022.07.12 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2022 වර්ෂය සදහා මිද්දෙනිය රථ වාහන නැවතුම් බදු ටෙන්ඩරය ලබා ගෙන ඇති අතර දැනට පවතින ආර්ථික අර්බුධය හේතුවෙන් එම ගෙවීම සඳහා 50%ක සහනයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත.

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම යටතේ 2022 ජුලි මාසය සඳහා අය කරනු ලබන වාරික මුදල වන රු. 12980.05 ක මුදලින් රු.6490.03ක මුදලක් අය කිරීමටත් 50% ක මුදල වන රු. 6490.02 ක මුදලක් අත් හැරීම සහ 2022 මැයි සහ ජුනි මාසය සඳහා අය කරනු ලබන මාසික වාරික මුදලින් 25% ක මුදල වන රු. 3245.01 ක් බැගින් එම මාස 02 සඳහා රු. 6490.02ක

මුදලක් අත්හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවත් ඊට අදාළ ඉතිරි මුදල් අය කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

මේ යෝජනාව සාධාරණයි. දැනට වාහන නවත්වන්නත් තැනක් නැති නිසා ඩිලිවරි වාහන එන්නෙ නැතුව ඇති . ඒ සඳහා සහනයක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම යටතේ 2022 ජුලි මාසය සඳහා අය කරනු ලබන වාරික මුදල වන රු. 12980.05 ක මුදලින් රු.6490.03ක මුදලක් අය කිරීමටත් 50% ක මුදල වන රු. 6490.02 ක මුදලක් අත් හැරීම සහ 2022 මැයි සහ ජුනි මාසය සඳහා අය කරනු ලබන මාසික වාරික මුදලින් 25% ක මුදල වන රු. 3245.01 ක් බැගින් එම මාස 02 සඳහා රු. 6490.02ක මුදලක් අත්හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **05 – 2. රාජ්‍ය වියදම් පාලනය කිරීම - පළාත් පාලන ආයතන අරමුදල්**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

රාජ්‍ය වියදම් පාලනය කිරීම - පළාත් පාලන ආයතන අරමුදල් මැයෙන් අංක කප්‍රාස 07 හා 2022.07.14 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඉතාමත් අත්‍යවශ්‍ය සහා කාර්යයන් පමණක් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සඳහා ඊටිමත් සහා සම්මුතියක් අනුව ඉදිරිපත් කළ යුතු බව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 02/08/05/03/කර්මාන්ත සහ 2022/06/23 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

## **05-02-i) කිරම කඩ කාමර 03ක් ස්ථාපිත කිරීම**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කිරම කඩ කාමර 03ක් ස්ථාපිත කිරීමේ කර්මාන්තයට අදාළව සකස් කරන ලද රු. 5507773.24ක ඇස්තමේන්තුව අනුව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත එම කර්මාන්තය සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

කර්මාන්තයේ නම- කිරම කඩ කාමර 03ක් ස්ථාපිත කිරීම

ඇස්තමේන්තු මුදල - රු.5507773.24

කර්මාන්තය ඉටු කිරීමට ඇති බලය - 2022 අයවැය යෝජනා

මෙම කාලය තුළ අදාළ කර්මාන්තය සිද්ධකිරීමේ අවශ්‍යතාවය- හැරණි කඩ කාමර කඩා ඉවත් කිරීම හේතුවෙන් අදාළ කඩ හිමියන්ට කඩිනමින් අලුතින් සකස් කර දිය යුතු වීම

මෙම කර්මාන්තය සිදු නොකිරීම නිසා ඇති විය හැකි තත්වයන් - අදාළ කඩ හිමියන්ට ජීවනෝපාය අහිමි වීම හා ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති වීම, සභාවට අහිමි විය යුතු ප්‍රතිලාභ අහිමි වීම

මෙම කර්මාන්තය නිසා ලබන සමාජ /මූල්‍ය ප්‍රතිලාභ - කඩ හිමියන්ට නැවත තම රැකියාව ලැබීම, ප්‍රාදේශිය සභාවට ප්‍රතිලාභ ලැබීම

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ජ්.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ සඳහා ඇස්තමේන්තු මුදල ලක්ෂ රු.5507773.24 ක මුදලක් තියෙනවා. අපිට මේ කඩ කාමර සකස් කරන්න සභා අරමුදල් ප්‍රමාණවත් නොවුණහොත් අපි ඒ අයගේ මුදල් වලින් සකස් කරලා කී මණී මුදලින් සහ බදු මුදල් වලින් අය කිරීම කරන්න පුළුවන්. නැත්නම් අපිට ඒ අයට කඩ කාමර ලබා දෙන්න ප්‍රමාද වීම මත ඒ අයට විශාල පාඩුවක් වෙන්න පුළුවන්. ඒ අයගේ ව්‍යාපාර කර ගෙන යන්න බැරි වෙන්න පුළුවන්. ඒ නිසා අපි මෙය ආණ්ඩුකාර අනුමැතියට යවමු.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍ර සේන මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ කිරම කඩ කාමර සම්බන්ධව කථා කරද්දී මම සභාවාර කිහිපයකදීම මතක් කළ විදියට කිරම පත්තර කඩය පවත්වා ගෙන යන ස්ථානය සඳහා වීධිමත් පරිදි ඉඩ පහසුකම් ඇති කඩ කාමරයක් මෙතෙක් ලබා දුන්නේ නැහැ. ඔබතුමා ඒ පිළිබඳ මේ සභාවේදීම ප්‍රකාශ කළේ කඩ කාමරයක් ලබා දෙන බවට. නමුත් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ පිළිබඳ මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මොකද කිරම කඩ හිමියන් සම්බන්ධව කෙතෙකුත් ප්‍රශ්න තියෙද්දී ඔය පත්තර කඩය එදා ඉඳන්ම කඩ කාමර කුලී විධිමත් පරිදි ගෙවා ගෙන කිසිදු ගැටළුවක් නැතිව පවත්වා ගෙන ආ තැනක්. ඒක එක්කම පත්තර කඩයක් නගරයට ඉතා අත්‍යවශ්‍ය දෙයක්. මිනිසුන් බොහෝ දෙනාට පත්තරයක් මිලදී ගන්න අවශ්‍ය වෙනවා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ සම්බන්ධව මම සොයා බැලුවා. කිරම බස් නැවතුම් පොළ කඩ කාමර ප්‍රමාණවත් නොවුණ තුන් දෙනෙකුටත් අලුතින් කඩ කාමර සකස් කරලා දෙන්න ඇස්තමේන්තු සකස් කරලා තියෙනවා.

එම ස්ථානයේ කඩ කාමර හතරක් ඉදි කරලා මේ පත්තර විකුණන ස්ථානය සඳහා ලබා දෙන්න අදහස් කලක් එතන තවත් කඩ කාමරයක් ඉදි කිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නැහැ. ඒ නිසා වරාපිටිය මාර්ගයට හැරෙන ස්ථානයේ තියන ඉඩ කඩ යොදා ගෙන එම ස්ථානයේ කඩ කාමරයක් සකස් කරලා දෙන්න බලාපොරොත්තු වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ සභාවේ අපි ගන්නා යම් යම් තීන්දු තීරණ පිළිබද අදාළ පාර්ශවයන් දැනුවත් කරනවා නම් හොදයි. උදාහරණයක් ලෙස අපි පත්තර විකුණන ස්ථානයට යම් තැනකින් කඩ කාමරයක් සකස් කරලා දෙනවා නම් ඒ අය කැඳවලා මෙහි ඒ සම්බන්ධව දැනුවත් කරන්න පුළුවන්. ඒත් එක්කම තිරම බස් නැවතුම් පොළ කඩ කාමර නොදී දැනට කඩ කාමර අලුතින් ඉදි කරලා සකස් කරලා දෙන්න කියලා පාර්ශව කිහිපයකට පොරොන්දු වෙලා තියෙනවා. ඒ අයවත් කැඳවලා මේ දෙන ක්‍රමවේදය පිළිබද දැනුවත් කරන්න. එතකොට ගැටළුවක් නැහැ. අපි සභාව නියෝජනය කරන නිසා අපෙන් යම් යම් දේවල් අහද්දී අපි සභාවේ තීරණය වූ පරිදි ඒ දේවල් කියනවා. මේ දේවල් පිළිබද ඒ අයව දැනුවත් කරනවා නම් ඊට වඩා හොදයි.

ඒ අනුව රු.**5507773.24** ක ඇස්තමේන්තුව අනුව තිරම කඩ කාමර තුනක් සකස් කිරීමට අදාළ යෝජනාව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05-02-ii) කටුවන නව මහජන පොළෙහි කඩ කාමර 11ක් ස්ථාපිත කිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන නව මහජන පොළෙහි කඩ කාමර 11ක් ස්ථාපිත කිරීම සභාවේ ප්‍රමුඛ කාර්යයක් බැවින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඇස්තමේන්තු මුදල - රු.**9246196.85**

කර්මාන්තය ඉටු කිරීමට ඇති බලය - මහා සභා තීරණ

මෙම කාලය තුළ අදාළ කර්මාන්තය සිදුකිරීමේ අවශ්‍යතාවය-පැරණි පොළ නව පොළ භූමියට ගෙන යන ලද බැවින් එහි ස්ථිර කඩ කාමර වෙළඳුන්ට කඩ කාමර නොමැති වීම හේතුවෙන්

මෙම කර්මාන්තය සිදු නොකිරීම නිසා ඇති විය හැකි තත්වයන් - ස්ථිර වෙළඳුන්ට තම ජීවනෝපාය අහිමි වීම , ප්‍රාදේශිය සභාවට ලැබිය යුතු ආදායම අහිමි වීම

මෙම කර්මාන්තය නිසා ලබන සමාජ /මූල්‍ය ප්‍රතිලාභ - මහජනයාට ප්‍රතිලාභ හිමිවීම, ප්‍රාදේශිය සභාවට මූල්‍ය ප්‍රතිලාභ හිමිවීම

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන පරණ පොළ කඩ කාමර හිමියන් සඳහා නව පොළ භූමියෙහි කඩ කාමර 11ක් ස්ථාපිත කරලා දෙන්න වෙනවා. අපි පොළ වෙනත් ස්ථානයකට රැගෙන යාමත් සමග වෙළඳුන් සඳහා රැකියාව අහිමි වුණා. ඒනිසා මෙම කාර්යය සිදු කිරීම අවශ්‍යයි.

**ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මම උඩගොමඩිය පොළ සම්බන්දයෙන් කිහිප වතාවක් කථා කළා. නමුත් මේ වන විටත් එහි කඩ කාමරයක් හෝ සකස් කර ගන්නට අපිට අවස්ථාව ලබා ගන්න බැරිවුණා. නමුත් ඒ සඳහා කිහිප දෙනෙක් ඒ අයගේ මුදල් වලින් එම කඩ කාමර සකස් කර ගැනීමට කැමැත්තෙන් සිටිනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ උඩගොමඩිය පොළ භූමියේ කඩ කාමර කිහිපයක් ඉදි කිරීමේ යෝජනාවත් මෙම ප්‍රමුඛ කාර්යයන් ගණයට යොදා සිදු කර දෙන්නැයි යෝජනා කරනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි එම උඩගොමඩිය පොළ කඩ කාමර කිහිපයක් ඉදි කිරීමත් මේ තීරණ සමගම අනුමත කර ගෙන සිදු කරමු.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙම සංවර්ධන කටයුතු සඳහා අපි සභාවේ අරමුදල් යොදා ගන්නවද? මේ අසීරු කාලය තුළ අපිට ප්‍රතිපාදන යොදවන්න පුළුවන්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ප්‍රතිපාදන නොමැති නිසා තමයි අපි ඒ අයගේ මුදලින් මේ කටයුත්ත කරන්නෙ. පසුව අපිට කී මණි මුදල අනුව මෙය නිදහස් කරන්න ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන්.

ඒ අනුව රු.9246196.85 ක ඇස්තමේන්තුව අනුව කටුවන නව මහජන පොළෙහි කඩ කාමර 11ක් ස්ථාපිත කිරීමට අදාළ යෝජනාව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**05-02-iii) එගොඩබැද්ද සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිවිලිම අලුත්වැඩියාව සහ මව්වරුන්ට විවේක ගැනිම සඳහා ආසන සකස් කිරීම**

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

**05-02-iii)** එගොඩබැද්ද සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිවිලිම අලුත්වැඩියාව සහ මව්වරුන්ට විවේක ගැනිම සඳහා ආසන සකස් කිරීම සභාවේ ප්‍රමුඛ කාර්යයක් බැවින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඇස්තමේන්තු මුදල - **රු.387253.46**

කර්මාන්තය ඉටු කිරීමට ඇති බලය - මහා සභා තීරණ

මෙම කාලය තුළ අදාළ කර්මාන්තය සිදුකිරීමේ අවශ්‍යතාවය-ගර්භනී මව්වරු සායන වල දිගු කාල සීමාවක් රැඳී සිටීම නිසා ඇතිවන කායික මානසික අපහසුතා මග හරවා ගැනීම මෙන්ම මනා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් පැවතීමේ අවශ්‍යතාවය.

මෙම කර්මාන්තය සිදු නොකිරීම නිසා ඇති විය හැකි තත්වයන් - සායන වල දිගු වේලාවක් රැඳී සිටීම නිසා මව්වරුන් විවිධ රෝගා බාධ වලට ගොදුරු වීමෙන් දුර්වල දරු උපත් සිදු වීම

මෙම කර්මාන්තය නිසා ලබන සමාජ /මූල්‍ය ප්‍රතිලාභ -මව්වරුන් යහපත් කායික මානසික සෞඛ්‍යයන් සම්පූර්ණ වීම නිසා නිරෝගී දරු උපත් සිදුවීම

ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ගරු සභාපතිතුමණි, මෙම සෞඛ්‍ය මධ්‍යස්ථාන පිළිසකර කිරීම් කටයුතු සඳහා අපිට වියදම් දරන්න පුළුවන්ද?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ගැටළුවක් නැහැ. අපි අයවැයෙන් සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. ඒ ප්‍රතිපාදන මේ කටයුත්ත සඳහා යොදා ගන්න පුළුවන්.

ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා

මට හිතෙන විදියට මේ සෞඛ්‍ය මධ්‍යස්ථාන ආදිය සඳහා ඒ ඒ දෙපාර්තමේන්තු , අධිකාරි මගින් ප්‍රතිපාදන වෙන් කරමින් ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනවා. අපි අයවැය මගින්

සෞඛ්‍ය අංශ සඳහා වෙන් කරලා තියෙන්නේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්න ඇති.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

නැහැ. අපි සෞඛ්‍ය අංශයේ කටයුතු සඳහා මුදල් වෙන් කරලා තියෙනවා. එහෙම සිදු කිරීමට නොහැකි සංවර්ධන කටයුත්තක් නම් ආණ්ඩුකාර අනුමැතිය ලැබෙන එකක් නැහැ. අපි අනුමැතියට යවලා බලමු.

ඒ අනුව එගොඩබැද්ද සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිවිලිම අලුත්වැඩියාව සහ මව්වරුන්ට විවේක ගැනීම සඳහා ආයන සකස් කිරීම සභාවේ ප්‍රමුඛ කාර්යයක් බැවින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05-02-iv) මිද්දෙනිය රාජපක්ෂ වෛද්‍ය සංකීර්ණයේ වැසිකිළි කාමරය ඉවත් කර කඩ කාමරයක් ඉදිකිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

05-02-iii) මිද්දෙනිය රාජපක්ෂ වෛද්‍ය සංකීර්ණයේ වැසිකිළි කාමරය ඉවත් කර කඩ කාමරයක් ඉදි කිරීම සභාවේ ප්‍රමුඛ කාර්යයක් බැවින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඇස්තමේන්තු මුදල - රු.1925382.02

කර්මාන්තය ඉටු කිරීමට ඇති බලය - මහා සභා තීරණ

මෙම කාලය තුළ අදාළ කර්මාන්තය සිදුකිරීමේ අවශ්‍යතාවය-වැසිකිළි පද්ධතිය අබලන්ව ඇති අතර අදාළ පරිශ්‍රය ඵලදායි කාර්යයක් සඳහා යොදා ගැනීම

මෙම කර්මාන්තය සිදු නොකිරීම නිසා ඇති විය හැකි තත්වයන් - අදාළ පරිශ්‍රයේ විවිධ සමාජ විරෝධි ක්‍රියා සිදුවීම හා නිෂ්කාර්ය , ලෙස උපයෝජිත වත්කමක් පල්‍යා පැවතීම

මෙම කර්මාන්තය නිසා ලබන සමාජ /මූල්‍ය ප්‍රතිලාභ - මහජනයාට අවශ්‍ය සේවා පහසුකම් හිමි වීම, ප්‍රාදේශීය සභාවට මූල්‍ය ප්‍රතිලාභ හිමිවීම

ගරු ප්‍රා.ස.ම.එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.බී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ගරු සභාපතිතුමණි, මෙම රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ වැසිකිළි පද්ධතිය ඉවත් කර කඩ කාමරයක් සකස් කිරීම මම හිතන්නේ පවතින මූල්‍ය තත්වය මත සිදු කිරීම සුදුසු නැහැ කියලා. එම කඩ කාමරය කී මණි මුදලින් හෝ සකස් කරනවා නම් ගැටළුවක් නැහැ. නමුත් දැනට පවතින සභා අරමුදලින් මේ දේවල් කළ විට සේවක පඩිනඩි ගෙවා ගැනීමට හෝ ප්‍රතිපාදන නොමැති වෙන්න පුළුවන්. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන අපි ඒ සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර කිමණි මුදල් මගින් එය සකස් කර ගන්නවා නම් ගැටළුවක් නැති බවත් තව දුරටත් ප්‍රකාශ කර සිටිනවා.

ගරු ප්‍රා.ස.ම. එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා

ගරු සභාපතිතුමණි, මේ රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ වැසිකිළි පද්ධතිය ඉවත් කිරීම සුදුසු ද? තවත් වැසිකිළි පද්ධතියක් තියෙනවද? සාමාන්‍යයෙන් වෙළඳ සංකීර්ණයක් තුළ වැසිකිළි පද්ධතියක් අත්‍යවශ්‍ය කාරණයක් නිසා මෙවා ඉවත් කිරීමෙන් පසුව නැවත සකස් කරන්න වෙන එකක් නැහැ. ඒ පිළිබඳව හිතන්න වෙනවා. මේක ආරක්ෂා කර ගන්න සභාවේ සේවකයින් යොදවලා පිරිසිදු කර ගන්න ක්‍රම වේදයක් යොදවන්න බැරිද?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මේ වැසිකිළි පද්ධතිය ඉතා ජරා ජීර්ණ තත්වයක තමයි පවතින්නේ. මිනිස්සු මෙය විනාශ කරලා .උඩ මහලෙත් වැසිකිළි පද්ධතියක් තියන නිසා එය භාවිතා කරන්න පුළුවන්. පොදු වැසිකිළියත් තියෙනවා. දැනට ප්‍රයෝජනයක් නොගන්නා නිසා මෙම ස්ථානයේ කඩ කාමරයක් ස්ථාපිත කලොත් එයින් සභාවට ආදායමක් ලබා ගන්න පුළුවන්.

ගරු ප්‍රා.ස.ම. ජේ.එල්. ජයන්ත මැතිතුමා

ගරු සභාපතිතුමණි, මෙම ස්ථානයේ වැසිකිළි පද්ධතිය අවශ්‍ය නැති බව තමයි මගේ අදහස. එතන සිදු වෙන්නේ ගොඩක් අයථා කටයුතු. මිනිස්සු මත්පැන් පානය කිරීම ආදිය සඳහාත් මේ ස්ථානය යොදා ගන්නවා. මිද්දෙනිය නගරයට හොඳ පොදු වැසිකිළියක් තියෙනවා. නමුත් එය පිහිටි ස්ථානය අනුව ඉඩකඩ මදි බවත් තියෙනවා. නමුත් මෙම වැසිකිළි පද්ධතිය ඉවත් කිරීම සුදුසු බව තමයි මගේ අදහස. අනෙක් කාරණය විදියට මිද්දෙනිය රණවිරු උයන පිළිබඳ සභාවේ අවධානය මදි බවත් පේනවා. ඒ සඳහා සභාවේ සේවකයෙක් යොදවලා නඩත්තු කටයුතු ඒ

කියන්නේ පිරිසිදු කිරීම කරනවා නම් හොඳයි. මේ දවස් වල බැම්ම කඩා වැටිලා තියෙනවා. ඒ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරනවා නම් හොඳයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

රණවිරු උයනෙහි බැම්ම ඒ අයම නැවතත් හදන බව කිව්වා. දැනට ගල්, වැලි ගෙනත් දාලා තියෙනවා. බැද්ද කැපීම සිදු කිරීම කරන්න අපි සතියකට දවසක් සේවකයෙක් යොදවලා තියෙනවා. දිනපතා එහි පිරිසිදු කිරීම් සිදු කරනවා. ඒ කාර්යය හරියට කරනවද කියලා අධීක්ෂණය කරලා බලමු.

ඒ අනුව රු.1925382.02 ක ඇස්තමේන්තුව අනුව මිද්දෙනිය රාජපක්ෂ වෙළඳ සංකීර්ණයේ වැසිකිළි කාමරය ඉවත් කර කඩ කාමරයක් ඉදි කිරීමට අදාල යෝජනාව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වයක් පැවතියද බහුතර මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත සභා සම්මත විය.

## <u>05 – 3. 2022 වර්ෂයේ ii කාර්තුවට අවශ්‍ය කරන ඖෂධ ඇණවුම් කිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 වර්ෂයේ ii කාර්තුවට අවශ්‍ය කරන ඖෂධ ඇනවුම් කිරීම මැයෙන් කිරම ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි වෛද්‍ය නිළධාරි තුමන් විසින් ඉදිරිපත් කර ඇති අංක ආයුනි/කි/03/01/2021 හා 2022.07.14 දිනැති ලිපිය අනුව ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා ඉල්ලුම් කර ඇති ඖෂධ සහ අරමුදලින් මිලදී ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි මේ ඖෂධ අරගෙන දෙමු. දැනට ආයුර්වේදය මගින් ලොකු සේවාවක් සිදු වෙනවා. දෙහිගහහේන ආයුර්වේද මධ්‍යස්ථානය මගින් මිනිසුන්ට සේවාවක් සිදු වෙනවා.

ඒ අනුව ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා ඉල්ලුම් කර ඇති ඖෂධ සහා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වාර්තා</u>

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.07.11 වන දින</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022.07.11 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 93 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බවත් අංක 01 සහ 02 යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තර | මුදල(රු) |
|---|---|---|---|
| 1. | සෝමසිරි ස්ටෝර්ස් (පුද්)සමාගම, සෝමසිරි ස්ටෝර්ස්, අගුණුකොළපැලැස්ස | කටුවන ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ භාවිතය සඳහා 37.5kg බර වූ ගෑස් සිලින්ඩර් 03 ක්2022.06.09 දින මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 54000.00 |
| 2. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,සිරම | 2022 මැයි මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 9400.00 |
| 3. | විජිත සර්විස් සෙන්ටර්,කටුවන පාර,මිද්දෙනිය | RC-5539 ට්‍රැක්ටර් රථය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම | 16230.00 |
| 4. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, හම්බන්තොට, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු කාර්යාලය,හම්බන්තොට | පහලවත්ත සුසානභූමි ඉඩම මැනුම් කටයුතු කිරීම සඳහා ගාස්තු ගෙවීම | 10800.00 |
| 5. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සීනි,තේ කොළ,හකුරු මිලදී ගැනීමට අදාළව ගෙවීම | 5000.00 |
| 6. | මුදල් භාරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ රියදුරු හා මුරකරු සේවයේ සේවකයින් හට වාර්ෂික නිල ඇඳුම් දීමනාව ලබා දීම | 72000.00 |
| 7. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1250.00 |
| 8. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණ සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 9. | එන්.එන්.වීරක්කොඩි මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2440.00 |
| 10. | ඒ.ඩී.පී.යමුනා නිල්මිණි මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2540.00 |
| 11. | කේ.පී.සංජීව මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1600.00 |
| 12. | කේ.ජී.අනුර මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5936.00 |
| 13. | එම්.දිනුෂික් රන්දුල් මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස . ගමන් වියදම් ගෙවීම | 4753.00 |
| 14. | එම්.දිනුෂික් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස ගමන් වියදම් ගෙවීම | 10500.00 |
| 15. | කුමාර පලිහක්කාර මයා,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8500.00 |
| 16. | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 17. | බී.ඩී.ඩී.එමිල් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 4828.00 |
| 18. | වරුණ ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 7472.00 |
| 19. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 20. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 2677.00 |
| 21. | බී.ජී.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 5153.00 |
| 22. | කේ.කේ.රාමචන්ද්‍ර මයා,ජල වැද්දුම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 1598.00 |
| 23. | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8583.00 |

| | | | |
|---|---|---|---|
| 24. | ඒ.කේ.ඒ.ශ්‍රිකාන්ත මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 7622.00 |
| 25. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 10816.00 |
| 26. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8750.00 |
| 27. | ප්‍රියන්ත ඒකනායක මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 7709.00 |
| 28. | පී.ඒ.රංජිත් මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 1746.00 |
| 29. | කේ.කේ.නාලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 7309.00 |
| 30. | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 3390.00 |
| 31. | පුෂ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8672.00 |
| 32. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 6162.00 |
| 33. | සුජිත් ලක්මාල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 1161.00 |
| 34. | ආර්.සංජීව මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 1010.00 |
| 35. | අමිල සම්පත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 909.00 |
| 36. | එම්.ඒ.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8444.00 |
| 37. | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 2933.00 |
| 38. | එම්.අමරශේරන් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8266.00 |
| 39. | ආරියරත්න මුතුකුමාරණ මයා, සෞඛ්‍ය කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 1148.00 |
| 40. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා, මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 10116.00 |
| 41. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 4899.00 |
| 42. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8064.00 |
| 43. | දිමුතු සුරංග මයා,ජල සහායක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8515.00 |
| 44. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 2350.00 |
| 45. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස ගමන් වියදම් ගෙවීම | 1750.00 |
| 46. | ඩබ්.සුභාෂණි මිය,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස ගමන් වියදම් ගෙවීම | 1170.00 |
| 47. | එම්.චම්පිකා චතුරාණි මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3710.00 |
| 48. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1370.00 |
| 49. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම | 20221.00 |

| | | | |
|---|---|---|---|
| 50. | ජේ.බිලාන් මයා,චන්ද්‍රා ස්ටෝර්ස්, මිද්දෙනිය පාර,කටුවන | 2022 මැයි මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 8540.00 |
| 51. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | කේ.පී.එම්.ආර්.රුචිර ප්‍රියංකර මහතාගේ සේවක අර්ථ සාධක අරමුදලෙහි ප්‍රතිලාභවලින් ආයතනයේ ප්‍රතිලාභ කොටස වන රු.10454.00 ක මුදල තැන්පත් ගිණුමෙන් ආදායමට මාරු කිරීම | 10454.00 |
| 52. | සාමාන්‍යාධිකාරී,ශ්‍රී ලංකා දුම්රිය සේවය,කොළඹ | 2022 පෙබරවාරි මස 2022761602 දරන ඉන්වොයිස් අංකයට අදාළ දුම්රිය බලපත්‍රවලට අදාළ මුදල් ගෙවීම | 840.00 |
| 53. | සාමාන්‍යාධිකාරී,සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගනු ලබන ඉන්ධන වටිනාකමට සරිලන ඉන්ධන ඇප තැන්පත් මුදල ලබා දීම( රු. 1000000ක උපරිමයකට යටත්ව) | 930000.00 |
| 54. | සාමාන්‍යාධිකාරී,සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීමට 2022.06.01 සිට2022.06.10 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• RC-5539-ඩීසල්-40L<br>• RD4364-ඩීසල්-34L<br>• PF-7414- ඩීසල්-110L<br>• RB-3498- ඩීසල්-33 L<br>• SNH2011153- ඩීසල්-67L<br>• BAK-9907- පෙට්‍රල්-20L<br>• ගබඩාව-පෙට්‍රල්-40L<br>• ගබඩාව- ඩීසල් -380L<br>• 53-1634- ඩීසල්-32L<br>• LL-7399-ඩීසල්-75L<br>• RE-9230-ඩීසල්-43L<br>• 227-5870- ඩීසල්-30L<br>• ZA -2978-ඩීසල්-130 L<br>• RE-8995-ඩීසල්-40L<br>• LL-6446-ඩීසල්-75L | 502600.00 |
| 55. | අගලකුඹුරුගොඩ ගොවි සමිතිය, වෙළඳගොඩ | කිරම බන්නැවකුඹුරපොළෙහි කින්හ ආලේප කිරීම කාර්මාන්තයේ 10% රඳවුම් මුදල නිදහස් කිරීම | 66277.17 |
| 56. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස ගමන් වියදම් ගෙවීම | 1750.00 |
| 57. | කේ.ජී.ටී.හර්ෂණී මිය,තාක්ෂණ සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස ගමන් වියදම් ගෙවීම | 1080.00 |
| 58. | කේ.ජී.ටී.හර්ෂණී මිය,තාක්ෂණ සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5250.00 |
| 59. | නාන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනාව ගෙවීම | 9136.00 |
| 60. | නාන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනාව ගෙවීම | 9136.00 |
| 61. | නාන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් ගමන් වියදම් ගෙවීම | 9450.00 |
| 62. | නාන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි ගමන් වියදම් ගෙවීම | 6790.00 |
| 63. | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් ගමන් වියදම් ගෙවීම | 5400.00 |

| | | | |
|---|---|---|---|
| 64. | ජී.කුසුමාවතී, කොලොන්ගහකොරටුව, විරන්කුරුවිගොඩ, කටුවන | කටුවන පොදු වෙළඳපොළ අපනශාලාවේ 2021 වර්ෂයට ටෙන්ඩරය ලබා ගැනීමේදී තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 2000.00 |
| 65. | ඩබ්.ඉෂාංකා මධුශානි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල්,මැයි මාසවල කිරම පෙර පාසලේ පෙර පාසල් පුහුණුව හැදෑරීම වෙනුවෙන් දීමනාව ගෙවීම | 11000.00 |
| 66. | කේ.ජී.එම්.පාවින්දි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල්,මැයි මාසවල මිද්දෙනිය පෙර පාසලේ පෙර පාසල් පුහුණුව හැදෑරීම වෙනුවෙන් දීමනාව ගෙවීම | 10500.00 |
| 67. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණ සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස ගමන් වියදම් ගෙවීම | 1060.00 |
| 68. | සෝමසිරි ස්ටෝර්ස් (පුද්)සමාගම, සෝමසිරි ස්ටෝර්ස්, අඟුණකොළපැලැස්ස | කටුවන ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ භාවිතය සඳහා 37.5kg පිර වූ ගෑස් සිලින්ඩර් 03 ක්2022.06.17 දින මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 54000.00 |
| 69. | සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පුද්) සමාගම,තල් අරඹ,කඹුරුගමුව,මාතර | කටුවන ප්‍රාදේශීය සභාව සතු ZA-2978 අංක දරන ට්‍රැක්ටර් යන්ත්‍රයේ අළුත්වැඩියාවක් සඳහා Hub Oil Seal එකක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 19656.00 |
| 70. | අයි.ජී.මංජුල මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 8222.00 |
| 71. | එස්.ජේ.චන්දන මයා,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 3910.00 |
| 72. | රෝහිත සිල්භාත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස අතිකාල දීමනා ගෙවීම | 3999.00 |
| 73. | ජී.ටී.පී.යමුනා නිල්මිණී මිය,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2760.00 |
| 74. | පී.රශ්මි රවිනා මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ වරිපනම් තක්සේරු කටයුතුවලට සහභාගි වීම හා සහාය වීම වෙනුවෙන් 2022.02.07 දින සිට 2022.05.31 දක්වා දෛනික දීමනාව ගෙවීම( දිනකට රු. 1600.00 බැගින්) | 139200.00 |
| 75. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 ජූනි මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 9520.00 |
| 76. | සමරසිංහ මෙටල් ක්‍රෂර්(පුද්) සමාගම,තලාව,කාරියමඩිත්ත | කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදලගොඩ මාර්ගයේ අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ABC ගල් කියුබ් 2.7 ක් මිලදී ගැනීම | 20250.00 |
| 77. | දම්මික ට්‍රේඩ් සෙන්ටර් පුද්ගලික සමාගම,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ කාර්යාලයක කණිෂ්ඨ සේවිකාවන් 11 දෙනෙකුට ලා අළු පාට සාරි 33 ක් ලබා දීම වෙනුවෙන් ගෙවීම් කිරීම(වාර්ෂික නිල ඇඳුම් ලබා දීම යටතේ කට්ටල තුන බැගින්) | 57750.0 |
| 78. | මහබෙල්පි ස්ටෝර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | ගරු උප සභාපතිතුමාගේ හා ලේකම්තුමියගේ නිල කාමරවල කාපට් ඇතිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 9690.00 |
| 79. | එල්.එච්.රසිකා දේශප්‍රිය,රෝස් මාට් හුස්,අංක 91,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික සේවා නිළධරයන්ට හා ආදායම් පරීක්ෂක නිළධරයන්ට අවශ්‍ය සපත්තු යුගල 04 ක් මිලදී ගැනීම ( වාර්ෂික නිල ඇඳුම් ලබා දීම යටතේ) | 11560.00 |
| 80. | චන්දිම ටේලර්ස් ඇන්ඩ් ටෙක්ස්ටයිල්ස්,කෝපරේටිව් කොම්ප්ලෙක්ස්,වලස්මුල්ල | කටුවන ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික සේවා නිළධරයන්ට හා ආදායම් පරීක්ෂක නිළධරයන්ට අවශ්‍ය නිල ඇඳුම් මසා නිම කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම ( වාර්ෂික නිල ඇඳුම් ලබා දීම යටතේ) | 90600.00 |
| 81. | ඩිපෝ කළමනාකරු,ශ්‍රී ලංගම,තංගල්ල | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ඉන්ධන සංචිත වශයෙන් අවශ්‍ය ඩීසල් 400L ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 184000.00 |

| | | | |
|---|---|---|---|
| 82. | ටී.සුසන්ත,නිලන්ත මෝටර්ස්,මිද්දෙනිය පාර,කිරම | කටුවන ප්‍රාදේශීය සභාව සතු 252-6508 කැබ් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම (පාකින් ලයිට්, සයිලන්සර්, බෝල් ජොයින්ට්,ඔයිල් කූලර් හෝස් ආදිය සඳහා) | 35400.00 |
| 83. | ජේ.ඒ.අනුර කුමාර,හයිඩ්‍රොලික් හෝස් සර්විස්,වීරකැටිය පාර,මිද්දෙනිය | ZA-2978 JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම ( ගියර් ඔයිල් ලීටර් 05, ග්‍රීස් 2kg ,කෑන් 1ක් මිලදී ගැනීම සඳහා) | 11100.00 |
| 84. | ජේ.ඒ.අනුර කුමාර,හයිඩ්‍රොලික් හෝස් සර්විස්,වීරකැටිය පාර,මිද්දෙනිය | ZA-2978 JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට හයිඩ්‍රොලික් ඔයිල් 5L මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 6900.00 |
| 85. | ජේ.එස්.එස්.සී.සමරසිංහ,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 252-6508 කැබ් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 32240.00 |
| 86. | ජේ.එස්.එස්.සී.සමරසිංහ,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 53-1634 කැබ් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 20440.00 |
| 87. | එස්.එම්.හෙවි හයිඩ්‍රොලික්, දුනුමඩලහේන, ගල්පොත්තයාය, සූලම්පිටිය | ZA-2978 JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුදල් ලබා දීම (දකුණු පස හබ් සද්ධනිය,ව්හෝල් වැල් බොක්ස් එකේ ඔයිල් කාන්දුව සෑදීම, එක්ස්ට්‍රාඩික් / එස්ටැබිලේටර් ඇජස් කිරීම, ජලේ වොෂර් අලුත්වැඩියාව) | 178000.00 |
| 88. | ප්‍රසාද් ඇළුමිනියම්,නුගම පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයට අයත් ගිණුම් අංශයට පිවිසෙන දොර සහ රැස්වීම් ශාලාව වෙත පිවිසෙන දොරෙහි අළුත්වැඩියා කටයුතු සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 8000.00 |
| 89. | ශක්ති සුභ සාධක සංගමය,ශ්‍රී මහින්ද නාහිමි මාවත,මිද්දෙනිය | මිද්දෙනිය නැගෙනහිර හුණුගේ අසලින් සේක්කවත්ත රක්ෂිතය මගින් වෙන්වන ගම් මායිම් පාර සංවර්ධනය කිරීම<br>10% රැඳවුම් මුදල-රු24939.74 | 224457.65 |
| 90. | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 91. | එස්.දුෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාවේ | 2022 මැයි මස පරිවර්තික ගමන් වියදම් ගෙවීම | 1455.00 |
| 92. | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාවේ | 2022 ජූනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1200.00 |
| 93. | සාමාන්‍යාධිකාරී,සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීමට 2022.06.15 සිට2022.06.30 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• LK-9589-ඩීසල්-50L<br>• PF-7414- ඩීසල්-135L<br>• 53-1634- ඩීසල්-70L<br>• 252-6508- ඩීසල්-180L<br>• RE-9230-ඩීසල්-28L<br>• ගබඩාව- ඩීසල් -320L<br>• 227-5870- ඩීසල්-127L<br>• PA-8630- ඩීසල්-60L<br>• RC-5539-ඩීසල්-40L<br>• RD4364-ඩීසල්-39L<br>• RB-8995- ඩීසල්-40 L<br>• RC-7796-ඩීසල්-20L<br>• RB-3498-ඩීසල්-20L | 466600.00 |

අගහස වවුචර් අංක 01 සිට 93 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) කටුවන ප්‍රාදේශීය සභාව සතු 252-6508 අංක දරන කැබ් රථයට හා 53-1634 අංක දරන කැබ් රථයට අලුතින් ටයර් යෙදීමට සුදුසු බව යෝජනා විය.
2) කටුවන ප්‍රාදේශීය සභාවේ ජල බිල්පත් මුද්‍රණය කරන IQ 2090 II දරණ මුද්‍රණ යන්ත්‍රයේ අක්‍රිය වූ කොටස මිලදී ගෙන අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා විය.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

සභාපතිතුමණි, මෙම වාර්තාවේ අංක 65, 66 යටතේ පෙර පාසල් වල පුහුණුව සඳහා දීමනාවක් ගෙවා තිබෙනවා. ඒ සභාවේ අයද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ කාර්මික ආයතන වලින් පුහුණුව සඳහා ලබා දෙන අය. දිනකට රු. 500.00ක දීමනාවක් ගෙවන්න අපිට අනුමැතිය ලැබිලා තියෙනවා. මේ අය මාස 06ක් සඳහා තමයි පෙර පාසල් පුහුණුව ලබා ගන්නේ.

ඒ අනුව අංක 01 සිට 93 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සහ 02 හි සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 ජූනි මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 වර්ෂයේ ජූනි මස මහ සභාව සතු සියළු වෙළඳ පොලවල් , මිද්දෙනිය පොල තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.405570.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 49642.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.355928.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජූනි මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 ජූනි මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 ජූනි මස වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:142250.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,වියදුරු වැටුප්, ඉන්ධන ආදි කටයුතු වෙනුවෙන් රු: 368157.00 ක වියදමක් දරා ඇත. ඒ අනුව යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් රු: 225907.00 අලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජූනි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 ජූනි

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා ජූනි මස රු.996050.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජූනි මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති බැවින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 07, 16 වාර්ථා

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 07,16 ආදායම් අයකර ගැනීම හා හිග ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 අප්‍රේල් මස ප්‍රා.ස. 14,16, 07 වාර්තා

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජූනි මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16,14,07 වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

### 08-1. කිරම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර තුනක් ඉදිකිරීම සහ රාජපක්ෂ වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් ඉදි කිරීමට අදාළ ඇස්තමේන්තු

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

කිරම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර තුනක් ඉදිකිරීම සම්බන්ධයෙන් තාක්ෂණ නිළධාරි විසින් 2022.07.18 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති කිරම පොදු වෙළඳපොළ සංකීර්ණයේ කඩ කාමර තුනක් ඉදිකිරීමට අදාළව නව මිළ ගණන් යටතේ සකස් කරන ලද රු. 5507773.24ක ඇස්තමේන්තුව සහ රාජපක්ෂ වෙළඳ සංකීර්ණයේ වැසිකිළිය ඉවත් කර කඩ කාමරයක් ඉදිකිරීමට අදාළ රු. 1925382.02 ක ඇස්තමේන්තුව අනුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ සම්බන්ධයෙන් අපි මුලින් කථා කළා. මේ ඇස්තමේන්තු වලට අදාළ කර්මාන්ත අපි ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සඳහා යවමු.

ඒ අනුව කිරම පොදු වෙළඳපොළ සංකීර්ණයේ කඩ කාමර තුනක් ඉදිකිරීමට අදාළව නව මිළ ගණන් යටතේ සකස් කරන ලද රු. 5507773.24ක ඇස්තමේන්තුව සහ රාජපක්ෂ වෙළඳ සංකීර්ණයේ වැසිකිළිය ඉවත් කර කඩ කාමරයක් ඉදිකිරීමට අදාළ රු. 1925382.02 ක ඇස්තමේන්තුව අනුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-2. උතුරු හග්ගිත කන්ද ග්‍රාම නිළධාරි වසමෙහි ඩේවිඩ් පීරිස් මාවතෙහි පිහිටි පැති බැම්ම සකස් කිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

අධික වර්ෂා තත්වය නිසා බෝක්කුවෙහි පැති බැම්ම කැඩියාම සම්බන්ධවයි මැයෙන් කිරම, උතුරු හග්ගිත කන්ද , ඩේවිඩ් පීරිස් මාවත , 243/A/2 යන ලිපිනයෙහි පදිංචි ඒ.පී. රෝහිත පෙල්ටන් කුමාර යන අය විසින් 2022.06.04 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උතුරු හග්ගිත කන්ද ග්‍රාම නිළධාරි වසමේ ඩේවිඩ් පීරිස් මාවතෙහි පිහිටා ඇති පැති බැම්ම කැඩී ගොස් ඇති බැවින් එය පිළිසකර කර දෙන ඉල්ලුම් කර ඇත. ඒ අනුව ඉදිරියේදී ඉන්ධන ලැබීමෙන් පසු තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත පිළිසකර කිරීම් කර දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

දැනට ඉන්ධන ප්‍රශ්නය නිසා මේ කාර්යයන් ප්‍රමාද වෙලා තියෙනවා. මේ සඳහා අපිට මුදල් වියදම් කරන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත තමයි සියලු සංවර්ධන කටයුතු සිදු කරන්න වෙන්නෙ.

ඒ අනුව උතුරු හග්ගිත කන්ද ග්‍රාම නිළධාරි වසමෙ ඩේවිඩ් පීරිස් මාවතෙහි පිහිටා ඇති පැති බැම්ම කැඩී ගොස් ඇති බැවින් එය පිළිසකර කර දෙන ඉල්ලුම් කර ඇත. ඒ අනුව ඉදිරියේදී ඉන්ධන ලැබීමෙන් පසු තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත පිළිසකර කිරීම කර දීම සම්බන්ධව සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-3 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව සභාව වෙත අයවිය යුතු වාර්ෂිකව බදු දී ඇති ටෙන්ඩර් දේපල අතුරින් පාඩු ලබන දේපල වල ටෙන්ඩර් ආදායම අත් හැරීම ( 2021.08.01 සිට 2021.08.20)</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව සභාව වෙත අයවිය යුතු වාර්ෂිකව බදු දී ඇති ටෙන්ඩර් දේපල අතුරින් පාඩු ලබන දේපල වල වාරික මුදල් අත් හැරීම මැයෙන් අංක කප්‍රාස 06 හා 2022.07.20 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය හා බැඳේ.

එහි සඳහන් පරිදි කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන ප්‍රාදේශිය සභාව විසින් 2021 වර්ෂයට අදාලව බදු දී ඇති දේපල වන මිද්දෙනිය මිද්දෙනිය රථ වාහන බදු අය කිරීම , කටුවන පොදු වෙළඳ පොළ ආපන ශාලාව බදු අය කිරීම , මිද්දෙනිය බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය බදු අය කිරීම යන දේපල වල 2021 අගෝස්තු මස නිරෝධායන ඇඳිරිනීතිය පැවතීම නිසා සහ පොළවල් නොපැවැත්වීමත් , නගරය වෙත ජනතාව නොපැමිණීමත් හේතු කර ගෙන බදු අය කිරීම සිදු නොකරන ලදී.

ඒ හේතුවෙන් 2021.08.01 සිට 2021.08.20 දින දක්වා කාල සීමාවට අදාළව කටුවන පොදු වෙළඳපොළ ආපන ශාලාවෙන් රු.54.25, මිද්දෙනිය රථ වාහන නැවතුම් බද්ද රු. 2157.00, මිද්දෙනිය බස් නැවතුම් පොළ පොදු වැසිකිළිය රු. 5163.00ක් වශයෙන් වූ රු. 7374.25ක අදාළ මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කර කපා හැරීම සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මාගනල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

මේ සම්බන්ධව අපි සභාවේ කතා කරලා තීරණයක් ගත්තා. මෙම හිඟ මුදල් අත් හැරීම සම්බන්ධව ආදායම් පරීක්ෂක වාර්තාව සහ සාධාරණීකරණ වාර්තාව මේ සමග ඉදිරිපත් කර තියෙනවා. ඒ නිසා ඒ වාර්තාවන්ද සමග අපිට ආණ්ඩුකාර අනුමැතිය සඳහා යොමු කරන්න පුළුවන්.

ඒ අනුව 2021.08.01 සිට 2021.08.20 දින දක්වා කාල සීමාවට අදාළව කටුවන පොදු වෙළඳපොළ ආපන ශාලාවෙන් රු.54.25, මිද්දෙනිය රථ වාහන නැවතුම් බද්ද රු. 2157.00, මිද්දෙනිය බස් නැවතුම් පොළ පොදු වැසිකිළිය රු. 5163.00ක් වශයෙන් වූ රු. 7374.25ක අදාළ මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කර කපා හැරීම සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08- 4 . 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව සභාව වෙත අයවිය යුතු වාර්ෂිකව බදු දී ඇති ටෙන්ඩර් දේපල වල වාරික මුදල් අත් හැරීම ( 2021.07.01 සිට 2021.07.31)</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව සභාව වෙත අයවිය යුතු වාර්ෂිකව බදු දී ඇති ටෙන්ඩර් දේපල අතුරින් පාඩු ලබන දේපල වල ටෙන්ඩර් දේපල වල වාරික මුදල් අත් හැරීම මැයෙන් අංක කප්‍රාස 06 හා 2022.07.20 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය හා බැඳේ.

එහි සඳහන් පරිදි කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයට අදාළව බදු දී ඇති දේපල වන මිද්දෙනිය රථ වාහන බදු අය කිරීම , කටුවන පොදු වෙළඳ පොළ ආපන ශාලාව බදු අය කිරීම යන දේපල වල 2021 ජූලි මස නිරෝධායන ඇදිරිනීතිය පැවතීම නිසා සහ පොළවල් නොපැවැත්වීමත් , නගරය වෙත ජනතාව නොපැමිණීමත් හේතු කර ගෙන බදු අය කිරීම සිදු නොකරන ලදි.

ඒ හේතුවෙන් 2021.07.01 සිට 2021.07.31 දින දක්වා කාල සීමාවට අදාළව මිද්දෙනිය රථ වාහන නැවතුම් බදු වාරික මුදල් රු. 7428.00ක් , කටුවන පොදු වෙළඳපොළ ආපන ශාලාව වාරික මුදල් රු.2107.78ක් හා දඩ මුදල් රු.149.05ක් වශයෙන් රු. 9684.83ක අදාළ මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව කපා හැරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මේ සඳහා ලබා දුන්න ආදායම් පරීක්ෂක වාර්තාව සහ සාධාරණීකරණ වාර්තාවන්ද පරීක්ෂා කර බලන්න පුළුවන්. මේ සමඟම එම වාර්තාවන් අපිට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යවන්න පුළුවන්.

ඒ අනුව 2021.07.01 සිට 2021.07.31 දින දක්වා කාල සීමාවට අදාළව මිද්දෙනිය රථ වාහන නැවතුම් බදු වාරික මුදල් රු. 7428.00ක් , කටුවන අපොදූ වෙළඳපොළ ආපන ශාලාව වාරික මුදල් රු.2107.78ක් හා දඩ මුදල් රු.149.05ක් වශයෙන් රු. 9684.83ක අදාළ මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව කපා හැරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-5. කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමරයක් ලබා ගැනීම - කේ. නිහාල් පද්මතිලක මයා

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කඩ කාමරයක් ලබා ගැනීම මැයෙන් කිරම,ජයවීර ගොඩ , ජයනි යන ලිපිනයෙහි පදිංචි කොඩිකාරගේ නිහාල් පද්මතිලක යන අය විසින් 2022.07.04 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව දේශීය ද්‍රව්‍ය මිලට ගැනීම, පළතුරු විකිණීම ආදිය සිදු කිරීම සඳහා කඩ කාමරයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මේ උඩු මහලේ කඩ කාමර සකස් කරලා ගන්න වෙනවා. ශාලාවක් විදියට තියන නිසා අපි කඩ කාමර වෙන් කරලා ආණ්ඩුකාර අනුමැතිය මත ඒ අයට ලබා දෙමු.

ඒ අනුව කිරම,ජයවීර ගොඩ , ජයනි ලිපිනයෙහි පදිංචි කොඩිකාරගේ නිහාල් පද්මතිලක යන අයට දේශීය ද්‍රව්‍ය මිලට ගැනීම, පළතුරු විකිණීම ආදිය සිදු කිරීම සඳහා කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කිරීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-06. කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමරයක් ලබා ගැනීම - ඩී.බී.ධන්කන් මයා

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කඩ කාමරයක් ලබා ගැනීම මැයෙන් කිරම,වල්දෙනිගහ ළඟ , වරාපිටිය යන ලිපිනයෙහි පදිංචි ඩී.බී.ධන්කන් යන අය විසින් 2022.06.04 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පාවහන් වෙළඳාම සඳහා කඩ කාමරයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම බස් නැවතුම්

පොළ උඩු මහලේ කඩ කාමර සකස් කර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී අයි.කේ.සුසන්ත පද්මතිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ අයට කඩ කාමර ලබා දෙන්න අවශ්‍ය පරිදි ආණ්ඩුකාර තුමන්ට අනුමැතියට යවමු.

ඒ අනුව කිරම,වල්අඳෙනිගහ ළඟ , වරාපිටිය යන ලිපිනයෙහි පදිංචි බී.බී.ධනන්කත් යන අයට පාවහන් ව්‍යාපාරයක් සිදු කිරීම සඳහා කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කිරීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-07. කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමරයක් ලබා ගැනීම - ශාන්ත කොඩිකාර මයා

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කඩ කාමරයක් ලබා ගැනීම මැයෙන් වරාපිටිය පාර, බටගස්ස, කිරම යන ලිපිනයෙහි පදිංචි ශාන්ත කොඩිකාර යන අය විසින් 2022.07.05 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පළතුරු වෙළඳාම සඳහා කඩ කාමරයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී අයි.කේ.සුසන්ත පද්මතිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ අයට කඩ කාමර ලබා දෙන්න අවශ්‍ය පරිදි ආණ්ඩුකාර තුමන්ට අනුමැතියට යවමු.

ඒ අනුව වරාපිටිය පාර, බටගස්ස, කිරම යන ලිපිනයෙහි පදිංචි ශාන්ත කොඩිකාර යන අයට පළතුරු වෙළඳාම සඳහා කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කිරීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-08. කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමරයක් ලබා ගැනීම - චන්දිම තෙන්නකෝන් මයා

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කඩ කාමරයක් ලබා ගැනීම මැයෙන් කාමරංගස්හේන, රදනිආර, කිරම යන ලිපිනයෙහි පදිංචි චන්දිම තෙන්නකෝන් යන අය විසින් 2022.07.05 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කෙටි ආහාර අලෙවිසැලක් සඳහා කඩ කාමරයක් ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී සිරිසේන හෙට්ටිගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මේ අයට කඩ කාමර ලබා දෙන්න අවශ්‍ය පරිදි ආණ්ඩුකාර තුමන්ට අනුමැතියට යවමු.

ඒ අනුව කාමරංගස්හේන, රදනිආර, කිරම යන ලිපිනයෙහි පදිංචි චන්දිම තෙන්නකෝන් යන අයට කෙටි ආහාර අලෙවිසැළක් සඳහා කිරම බස් නැවතුම් පොළ උඩු මහලේ කඩ කාමර සකස් කිරීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත කඩ කාමරයක් ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-9. වවුචර් සඳහා ගෙවීම කිරීම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01. වවුචර් අංක 542 - රෝහිණී අබේනායක, - කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 .06.23 වන දින පැවති මහ සභාවේ සංග්‍රහ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීම-රු.35930.00

02. වවුචර් අංක 142-148 - කටුවන ප්‍රාදේශීය සභා පොළ ව්‍යාපෘතිය යටතේ බදු එකතු කරන්නන් සඳහා 10% කොමිස් මුදල් ගෙවීම - රු.43642.00

03. වවුචර් අංක 149- ලේකම් , ප්‍රාදේශීය සභාව , අම්බලන්තොට- කටුවන පොළ භූමියේ වැසිකිළි අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් ගලි බවුසරය සඳහා මුදල් ගෙවීම - රු. 25000.00

04. වවුචර් අංක 533- ලිෂාන් සයිකල් පැලස්, වීරකැටිය පාර, මිද්දෙනිය, කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ මුළුතැන්ගෙයි භාවිතා කරන ලබන බොයිලේරුව අළුත්වැඩියාව- රු. 7680.00

05. වවුචර් අංක 543 - එස්.ටී.ඔටෝ ඉරපෙයාරින් සෙන්ටර්, හුංගම පාර, මුරුංගස්යාය. –PF 7414 කැබ් රථය අළුත් වැඩියා කිරීම - රු. 186250.00

06. වවුචර් අංක 538 - මුදල් භාරකරු , ප්‍රාදේශීය සභාවේ සුළු මුදල් අග්‍රිමය අළුත් කිරීම - රු. 24750.00

07. වවුචර් අංක 548 - ගයා ප්‍රින්ට් ෂොප් , හුංගම පාර , මිද්දෙනිය - කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනවසර කසළ බැහැර කිරීමේ දැන්වීම් පුවරු සඳහා ස්ටිකර් අකුරු නිර්මාණය කිරීම - රු. 36000.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා</u>

අපි මේ වවුචර් සඳහා ගෙවීම් කරමු.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් කඩිනමින් ගෙවීම කළ යුතු බැවින් එම වවුචර් පරීක්ෂා කර බලා ගෙවීම කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-10. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ජේ.ටී.ශාන්ත මැතිතුමා</u>**

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයක් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ජේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>09.ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>**

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, ඔබතුමාගෙන් දැන ගත යුතු කාරණයක් තියෙනවා. කිරම නගරයේ ජංගම මාළු අලෙවි සැලක් සඳහා සකස් කරන ස්ථානයේ ඉදිකිරීමක් කරනවද? ඒ සඳහා නිශ්චිත පුද්ගලයෙක් නම් කරලා තියෙනවද? ගිවිසුම් ගත වෙලා අවශ්‍ය කටයුතු සිදු කරලා තියෙනවද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඔව්. අපිට ඒ සඳහා අනුමැතිය ලැබුණේ ගරු ආණ්ඩුකාරතුමාගෙන්. මම මීට පෙර සභාවක මේ සඳහා අනුමැතිය ලබා ගත්තා. දැනට ගිවිසුම් ගත වෙලා නැහැ. ඉදිරියේදී එම කටයුත්ත සිදු කරනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ සභාවේ ප්‍රකාශ කරන්න විශේෂ කාරණා නොතිබ්බත් මම කැමතියි විදි පහන් ක්‍රියා කිරීම පිළිබඳ නැවත මතක් කිරීමක් කරන්න. අපේ ප්‍රදේශ වල විදි පහන් තිබීම විශාල ප්‍රයෝජනයක් වෙනවා. ඒ නිසා එම කටයුතු නැවත පටන් ගන්නවා නම් හොදයි. අපි මේ කටයුත්ත නතර කලෙත් විදුලි අර්බුධය හේතු කරගෙන. ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඊත් එක්කම ජල අංශයේ බිල් බෙදන අයගේ රාජකාරි කටයුතු පා පැදියෙන් සිදු කරන්න අමාරුයි. මොකද ඒ අය විශාල දුරක් ගමන් කරනවා. ඒ නිසා යම් තෙල් ප්‍රමාණයක් හෝ ලබා දීලා ඒ කාර්යය සිදු කරන්න යතුරු පැදි භාවිතා කිරීමට පහසුකම් සපයා දෙන්න කියලා මතක් කරනවා.

ඊත් එක්කම දැනට සභාවේ අත්‍යාවශ්‍ය කාරණා හැරුණු කොට වෙනත් කාර්යයක් සඳහා වියදම් සිදු කරන්න අවකාශ නැහැ. වියදම් අවම කිරීමේ තීරණය යටතේ අපට සභාවේ වාහන විශේෂයෙන්ම ට්‍රැක්ටර් ආදිය දිනපතා රාජකාරි කටයුතු සඳහා වාර කිහිපයක් යොදවා දිනක් හැර දිනක් හෝ ධාවනය වන විදියට සකස් කරන්න බැරිද? එහෙම වුණොත් අපිට ඉන්ධන යම් ප්‍රමාණයක් ඉතිරි කර ගන්න පුළුවන් වෙනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ට්‍රැක්ටර් අපි පොළවල් වල පිරිසිදු කිරීම් සඳහාත් යොදවන නිසා ගැටළුවක් වෙනවා. ඒවායේ මාළු පොළවල් නියමිත වෙලාවට ඉවත් කළ යුතුයි. අපි ලැබෙන ඉන්ධන ප්‍රමාණය ට්‍රැක්ටර් ටික සඳහා ලබා දීලා මේ කාර්යය සිදු කරනවා. ඉදිරියේදී ඉන්ධන යම් ප්‍රමාණයක් ලැබුණ ගමන් විදි පහන් කටයුතු සිදු කරමු. අපි යම් ආකාරයට විදුලි බලය ඉතිරි කළා කියලා ලොකු ඉතිරියක් නොවෙන්න පුළුවන්. ඒ නිසා තෙල් ප්‍රශ්ණය විසඳා ගත්තු ගමන් අපි මේ කටයුතු වහා සිදු කරමු.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.කේ.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අපි මුලින් කථා කරන ලද පරිදි සභා වාර්තා වල තියන අඩුපාඩු පිළිබඳ ගරු චන්ද්‍රසේන මැතිතුමත් දැඩිව අවධාරණය කළා. ඒ දේවල් නිවැරදි වෙන්න අවශ්‍යයි. ඒ පිළිබඳ අපි ඊට වඩා සැලකිලිමත් වෙන්න අවශ්‍යයි. අනෙක් කාරණය විදියට රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ ප්‍රශ්නය පිළිබඳ සැලකිලිමත් වෙද්දි සභාව නියෝජනය කරන අපිත් මේ සඳහා වගකියන්න වෙනවා. කොහොමද එතරම් වෙළඳ සංකීර්ණයක් සකස් කරලා මේ වන තෙක් ජනතාවට අවශ්‍ය සේවය අපිට ලබා දෙන්න බැරි වෙලා තියෙනවා. පොදු වැසිකිළිය එතනින් ඉවත් කරන තත්වයට පත් වෙලා තියෙන්නේ ඒ සඳහා අපේ සැලකිලිමත්කම අඩු නිසා, ඒ වගකීම අපිට භාර ගන්නම වෙනවා. අනික් කාරණය විදියට අපි ගිය සභාව තුළ කථා කළ සභාවට අයවැය පිළිබඳ මේ සභාවට වාර්තාවක් ලබා දෙයි කියලා මම බලා පොරොත්තුවෙන් පැමිණියා. නමුත් එවැනි ප්‍රගතියක් වෙලා නැහැ.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට මේ සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්න ඒ සාකච්ඡාවන් සඳහා අදාළ පාර්ශවයන් කැඳවන්න බැරි වුණා. ප්‍රගතියක් නොමැතිව වාර්තාවක් ඉදිරිපත් කරන එකේ තේරුමක් නැහැ.. ඉන්ධන ප්‍රශ්නයක් එක්ක එම කටයුතු ප්‍රමාද වෙනවා. අදත් කුමාර ස්ටීකර් ආයතනය සමඟ තියන සාකච්ඡාවට ඉන්ධන ප්‍රශ්නය හේතු කර ගෙන නොපැමිණෙන බව අපිට දන්වලා තියෙනවා.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.කේ.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>**

අනෙක් කාරණය විදියට සභාවේ ආදායම හා වියදම වාර්තාවක් ලෙස සභාවට ඉදිරිපත් කරනවා නම් අපිට සමස්ත ප්‍රතිඵලය ලාභයක්ද, අලාභයක්ද යන්න පිළිබඳ සන්සන්දනාත්මකව බලන්න පුළුවන්. ඒ නිසා එවැනි වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. අනෙක් කාරණය විදියට රට තුළ විශාල ලෙස කළු කඩ නිර්මාණය වෙමින් තියෙනවා. සියලු භාණ්ඩ මිල ඉහළ ගිහින් තියෙනවා. මුදල් කමිටුව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මුදල් කමිටුවට ඉදිරිපත් කරන සියලු වවුචර් නියි පරිදි පරීක්ෂා කරන්න. ඒවා මිලදී ගත් ආයතන හා මිලදී ගත් භාණ්ඩ සම්බන්ධව පරීක්ෂා කරන්න. ටෙන්ඩර් පටිපාටිය පරීක්ෂා කර බලන්න. මේ රට තුළ ආර්ථිකය යම් අර්බුධකාරී තත්වයක පවතින නිසා අපි හැකි අයුරින් ජනතාවට සහන සලසා දෙමින් කටයුතු කරන්න අවශ්‍යයි. ජනතාව ඉතා පීඩිත ජිවිත ගත කරනවා.මේ සම්බන්ධව සියලු දෙනාගේ අවධානය යොමු කරමින් ඒ සඳහා ජනතා සේවය සඳහා හැකි අයුරින් දායකත්වය ලබා දීමට ඔබ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

## <u>10. - ස්තුතිය හා නිමාව.</u>

අද දින 2022 වර්ෂයේ ජූලි මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වුන අපේ ගරු උප සභාපතිතුමන්, හිටපු ගරු සභාපතිතුමන්ලා , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරීතුමීය, ඇතුළු සියළුම දෙනාට ස්තුතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලද අතර සභාවේ වැඩ කටයුතු නිම කරන ලදී.

ප.ව 02.00 ට පමණ සභා නකාමෙර් සතුටින් විසිර ගියහ.

.........................

අයි. ජී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

අයි.ජී.මහින්ද
සභාපති
කටුවන ප්‍රාදේශීය සභාව
මිද්දෙණිය